**විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ විශ්‍රාම වැටුප් නිලධාරීන් සඳහා වන II වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2016**

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක PSC/ET /3/1/25/1/2 හා 2011.08.18 දිනැතිව අනුමත කරන ලද විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ විශ්‍රාම වැටුප් නිලධාරී බඳවා ගැනීම් පටිපාටියේ 8 ඡේදයේ විධිවිධානයන්ට අනුකූලව විශ්‍රාම වැටුප් නිලධාරී II වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන II වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් 2016 ජූලි මාසයේදී පවත්වන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. විශ්‍රාම වැටුප් නිලධාරී II වන ශ්‍රේණියේ නිළධාරීන් සඳහා මෙම විභාගය කොළඹ දී පමණක් පැවැත්වේ.

03. මෙම විභාගය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ.

04. සුදුසුකම් - විශ්‍රාම වැටුප් නිලධාරී II වන ශ්‍රේණියේ පත් වීමක් ලබා ඇති නිළධරයන් මෙම විභාගය සඳහා ඉදිරිපත් වීමට සුදුසුකම් ලබයි.

05. අයදුම්පත්‍ර- අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය. අංක 01 සිට 05 තෙක් ඡේද පළමුවන පිටුවටද අංක 6 සිට ඉදිරියට ඇති ඡේද අනෙක් පිටුවටද, ඇතුලත් වන පරිදි "ඒ4"ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙල කරන ලද අයදුම්පත්‍රයෙහි අපේක්ෂකයාගේ අත්සන ආයතන/අංශ ප්‍රධානියා මඟින් සහතික කර 2016 ජූනි මස 20 දින හෝ ඊට පෙර ලැබෙන සේ "විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,මහලේකම් කාර්යාල ගොඩනැගිල්ල,මාලිගාවත්ත,කොළඹ 10"යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. එක් අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කල යුත්තේ එක් අයදුම්පත්‍රයක් පමණක් වන අතර අයදුම්පත්‍රයේ ඡායා පිටපත් නොඑවන මෙන් දන්වා සිටිනු ලැබේ. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. අයදුම්පත් ඉදිරිපත් කරන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙලවරේ විභාගයේ නම සඳහන් කල යුතුය.අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අදාළ තොරතුරු සම්පූර්ණ කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

06. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය- අපේක්ෂකයින් විභාග ශාලාව තුලදී පෙනී සිටින සෑම විෂයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කල යුතුය.ඒ සඳහා පහත ලියකියවිලිවලින් එකක්.ඉදිරිපත් කල යුතුය.

(i) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත;

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අභිමතය පරිදි අවලංගු කල හැකිය. විභාග පැවැත්වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ.එම නීතිරීති උල්ලංඝනය කලහොත් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

07. අයදුම්පත් ඉදිරිපත් කර ඇති නිළධාරීන්වෙත ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් විභාග කාල සටහන සමඟ විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනවා ඇත.විභාගයට පෙනී සිටින නිළධාරීන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශපත්‍ර ඉදිරිපත් කල යුතුය.

සටහන:අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශපත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

08. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර ඇති නිළධාරීන්ට විභාගයට පෙනීසිටීමට හැකිවන පරිදි ආයතන ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබාදිය යුතුය.ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

09. මෙම විභාගය සිංහල හා දෙමළ යන මාධ්‍ය වලින් පැවැත්වේ. තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ මෙම විභාගයට පෙනී සිටිය හැකිය.විභාගය සඳහා ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

10. සාමාර්ථය සඳහා එක් එක් විෂයට නියමිත මුළු ලකුණු වලින් අවම වශයෙන් සියයට හතලිහක් (40%) බැගින් ලබාගත යුතුවේ.

11. විභාගයට පෙනීසිටි සියළුම අයදුම් කරුවන්ගේ ප්‍රතිඵල ඇතුලත් ප්‍රතිඵල ලේඛණය ශ්‍රී ලංකා පරිපාලන අයතනය මඟින් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත ලබා දෙනු ඇත.

12. විභාග පරිපාටිය : අපේක්ෂකයන් පහත දැක්වෙන විෂයන් ඇතුලත් ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.

| | විෂය | මුළු ලකුණු | කාලය | විෂය අංක |
|---|---|---|---|---|
| 1. | සමාජ ආර්ථික ප්‍රතිලාභ හා විශ්‍රාම වැටුප් | 100 | පැය 02 1/2 | 01 |

12.1 සමාජ ආර්ථික ප්‍රතිලාභ හා විශ්‍රාම වැටුප්
I ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික ප්‍රතිපත්ති
II සමාජ ආරක්ෂණ ක්‍රම
III වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය හා රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල

13. මෙම විභාග නිවේදනය සිංහල.දෙමළ,ඉංග්‍රීසි භාෂාත්‍රයෙන්ම පළකරනු ලබන අතර එම භාෂා පද මාලා අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් සිංහල භාෂා පද මාලාව බලාත්මක වන බව සැලකිය යුතුය. තවද ,මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත.

ඒ.ජගත් ඩී.ඩයස්
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

2016 ජුනි මස 03 වැනි දින
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
මාළිගාවත්ත
කොළඹ 10

ආදර්ශ අයදුම්පත්‍රය

විශ්‍රාම වැටුප් නිලධාරී II වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2016

Second Efficiency Bar Examination of Pension Officers – 2016

ඔබ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය

සිංහල - 1

දෙමළ - 2 ☐

1.0 1.1 මුල්'කුරු අගට යොදා මුල්'කුරු සමඟ නම:
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
උදා:- GUNAWARDANE, M.G.B.S.K.

1.2 මුල්'කුරු සමඟ නම:
(සිංහලෙන්/ දෙමළෙන්)

1.3 මුල්'කුරු වලින් හැඳින්වෙන නම්:
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.4 මුල්'කුරු වලින් හැඳින්වෙන නම්:
(සිංහලෙන්/ දෙමළෙන්)

2.0 සේවා ස්ථානය හා ලිපිනය:

2.1 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම හා ලිපිනය:
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම හා ලිපිනය:
(සිංහලෙන්/ දෙමළෙන්)

2.3 විභාග ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය:
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3.0 ස්ත්‍රී/පුරුෂ භාවය:

ස්ත්‍රී - 1

පුරුෂ - 0 ☐

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

4.0 ජාතික හැඳුනුම්පත් අංකය: ☐☐☐☐☐☐☐☐☐☐☐☐

5.0 ඔබ ඉදිරිපත් වන විෂයය/ විෂයයන්:

| විෂයය | විෂය අංකය |
|---|---|
| | |

6.0 දැනට දරන තනතුර:

6.1 තනතුර:

6.2 පත්වීම් ලිපියේ අංකය:

6.3 විශ්‍රාම වැටුප් නිලධාරී තනතුරේ II ශ්‍රේණියට පත්වූ දිනය:

7.0 අයදුම්කරුගේ සහතිකය:

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බවත්, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ගනු ලබන තීරණ වලට හා සියළු විධිවිධානයන්ට මම යටත් වන බවත් මෙයින් ප්‍රකාශ කර සිටිමි.

..................................................................

අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ අත්සන

දිනය:

සටහන: තමාගේ ආයතන ප්‍රධානියා හෝ එම ආයතන ප්‍රධානියා වෙනුවෙන් අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු හෝ ඉදිරිපිටදී අයදුම්කරු විසින් අත්සන් කළ යුතුය.

**අත්සන සහතික කිරීම**

මාගේ කාර්යාලයේ නිලධාරියෙකු/ නිලධාරිනියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන ............................................ මහතා/මහත්මිය/මෙනවිය ................................ වැනි දින මා ඉදිරිපිටදී අත්සන් කළ බව සහතික කරමි.

..................................................................

සහතික කරන්නාගේ අත්සන හා නිල මුද්‍රාව

දිනය:

නම:

පදවි නාමය:

ලිපිනය:

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

i ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්;

ii මෙම නිලධාරියා/නිලධාරිනිය* මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත්;

මම සහතික කරමි.

*අනවශ්‍ය වචන කපා හරින්න

..........................................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

දිනය:

නම:

පදවි නාමය:

ලිපිනය: